**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය - 2023**

**------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආරෝග්‍යශාලා මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආරෝග්‍යශාලා මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආරෝග්‍යශාලා මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී

පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආරෝග්‍යශාලා මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආරෝග්‍යශාලා මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 80 ඡේදය පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමේදී වර්ෂයකට අඩු කාලපරිච්ඡේදයක් තුළ නිරවුල් කිරීමට නියමිත බැරකම් පමණක් ජංගම බැරකම් යටතේ වර්ගීකරණය කළයුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස පාරිතෝෂික සඳහා වෙන්කිරීම් මුළු වටිනාකම වූ රු.53,728,397ක් ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි. | සේවයෙන් ඉවත්වන නිලධාරීන් සඳහා පාරිතෝෂික වෙන්කිරීම ගෙවිය යුතු පාරිතෝෂික වියදමක් ලෙස ජංගම වගකීම් යටතේ ගිණුම්ගතකිරීමට හා වසරක් සම්පූර්ණ කරන සියළුම සේවකයින් සඳහා වෙන්කරන මුදල ඉදිරියේදී ජංගම නොවන වගකීමක් ලෙස වර්ගීකරණය කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 49 ඡේදය පරිදි දේපල, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන්නේනම් එම වත්කම අයත්වන දේපල, පිරියත හා උපකරණ පංතියම ප්‍රත්‍යාගණනයට ලක්කළයුතු වුවත් රු.8,500,000ක් වටිනා වාහනයක් වර්ෂය තුළදී ප්‍රත්‍යාගණනය නොකොට අනෙකුත් වාහන සියල්ල ප්‍රත්‍යාගණනය කර තිබුණි. | පරිත්‍යාගයක් ලෙස ලැබී ඇති මෙම වාහනය ප්‍රත්‍යාගණිත අගය ගිණුම්ගත කිරීම Amortization of Donation Assets ගිණුමටද බලපෑමක් සිදුවන බැවින් එසේ 2023 වර්ෂයේ ප්‍රත්‍යාගණිත අගය ඇතුලත්කර ගිණුම් නොමැති බව හා 2024 වර්ෂයේ ප්‍රත්‍යාගණිත අගය ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් මණ්ඩලය දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු. 173,482,995ක්වූ වත්කම්වල ඵලදායී ජීවකාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධනයකර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතුකර නොතිබීමෙන් එකී වත්කම්වල වටිනාකම ශුන්‍ය වී පැවතුණි. | මේ පිළිබඳව ජීව විද්‍යා ඉංජිනේරු ආයතනය සහ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති අතර එම ආයතන වලින් එසේ නොකරන බව දන්වා ඇති බැවින් වත්කම් ඇස්තමේන්තු කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට නොහැකි වී ඇති බව. | -එම- |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රෝහල සතු වාහන 04ක් 2023 අගෝස්තු 29 දිනැති තක්සේරු වාර්තාවක් අනුව ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර එම වත්කම් සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය වටිනාකම රු.4,438,356කින් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව එම වටිනාකමෙන් වර්ෂයේ ඌණතාවය වැඩියෙන් හා ජංගම නොවන වත්කම් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම වාහන 04ම වසර මුල සිටම ධාවන මට්ටමේ තිබුණු බැවින් ප්‍රත්‍යාගණිත වටිනාකම මත වර්ෂයටම ක්ෂය කරන ලද බව | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේ සිදුකරන ලද අක්ෂි සායනයේ විදුලි නවීකරණය සම්බන්ධයෙන් ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CECB) 2023 සැප්තැම්බර් 07 දින වටිනාකම රු.1,269,219ක්වූ බිල්පත් ඉදිරිපත් කර තිබුණි. අදාල වියදම උපචිත වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙම කාර්යය 2020.12.05 දින අවසන්කර තිබුණු නමුත් අදාල කොන්ත්‍රාත් සමාගමේ බිල්පත් CECB මගින් අනුමත කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් 2021,2022 යන වසරවල ගෙවීමට ඉදිරිපත් නොවූ බව, 2023.09.06 දින අනුමත කරන ලද බිල්පත සඳහා මු.රෙ. 115 යටතේ ඉකුත් ගෙවීම් නිදහස් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලීම් කර ඇති බව හා ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලැබෙන තුරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකරන බැවින් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් නොකල බව. | එම |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය උපකරණ, ගෘහ භාණ්ඩ හා උපකරණ, පරිගණක හා යන්ත්‍රෝපකරණ යන විෂයයන් 04කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනු හා ලේඛන අනුව වටිනාකම අතර රු.1,611,954ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාල උපලේඛන නැවත පරීක්ෂා කරමින් පවතින බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන්, ලෙජර් ගිණුම් ශේෂයන් සමඟ සැසඳීම් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 2.1 හා 2.2 සිට 2.6 දක්වා වූ වගන්ති | කාර්ය මණ්ඩලයේ සෑම සේවයක හා ශ්‍රේණියක තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, තනතුරෙහි වැටුප් පරිමාණය, වයස් සීමාව සහ අදාළ අනෙකුත් විස්තර ඇතුළත්කර බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මේ වනවිට රෝහල් අධ්‍යක්ෂ තනතුර සඳහා වූ බඳවාගැනීමේ පටිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර ඇති බව හා අනෙකුත් තනතුරු සඳහා බඳවාගැනීමේ පටිපාටි සකස්කිරීම වෙනුවෙන් උපදෙස් ලබාගැනීම පිණිස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් සිටින බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියළුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වූ වාර්තා තබා ගත යුතු වුවද, රෝහලේ පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | 2023.11.09 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිත කිරීම පිළිබඳව සවිස්තරාත්මකව සාකච්ඡා වී ඇති බව හා රෝහලට සම්බන්ධ සියළුම වෘත්තීය සමිතිවලින් ඉදිරිපත් වී තිබුණු ඉල්ලීම් සලකා බැලීමෙන් පසු ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතය රෝහලට අවශ්‍ය නොවන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇති බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.17,078,072ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.6,647,614 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,430,458 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා පරිභෝජන වියදම් රු.70 ,680,881 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් අනුව කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම වෙනුවෙන් රෝහල විසින් 2022 වර්ෂයේදී වැයකරන ලද රු.2,249,167ක මුදල සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරවා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත මෙම මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට අදාල සියළු ලියවිලි ඉදිරිපත් කර ඇති බව හා මේ වනතෙක් එම මුදල් ප්‍රතිපූර්ණය කිරීම සිදුකර නොමැති බව. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 හා 2023 වර්ෂයන්හිදී සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,470,711ක්වූ හිඟ ණය වටිනාකම විගණිත දින වන 2024 ජුනි 15 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම හෙද නිලධාරීන් නොදන්වා සේවය හැරගොස් රටින් පිටව ගොස් ඇති අතර ඔවුන් සේවයෙන් ඉවත්වීමේදී සේවකයා විසින් රෝහල වෙත ලබාදිය යුතු අයදුම්පත ලබා නොදීම හේතුවෙන් පාරිතෝෂික මුදල්ගෙවීම් කර නොමැති බැවින් රෝහල වෙත අයකරගතයුතු ණය ශේෂයන් අයකරගැනීමට නොහැකි වී ඇති බව. | එම |
| (ඇ) | රෝහලේ ළමා රෝග සායනය හා උගුර, කණ, නාසය සායනය 2021 වර්ෂයේ සිට පවත්වා නොතිබුණු අතර පවුල් වෛද්‍ය සායනය 2023 වර්ෂය තුළ පැවැත්වීමට අපොහොසත්ව තිබුණි. | මෙම සායන පවත්වාගෙන ගිය විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනාම රෝහලේ ස්ථිර දෙදෙනෙකු නොවූ අතර 2022 වර්ෂයේ ඔවුන් දෙදෙනාම රෝහලෙන් ඉවත්ව යාමත් සමඟ මෙම සායනය පවත්වා නොමැති බව. | පවත්නා සම්පත් කාර්යක්ෂමව භාවිතයට ගෙන සඳහන් කරන ලද සායනයන් පැවැත්වීමට කටයුතු කල යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 ඖෂධ හා උපාංග ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1 හා 2.2 මාර්ගෝපදේශ ප්‍රකාරව ඖෂධ හා වෛද්‍ය උපාංග මිලදීගැනීමේදී සියළුම ලංසුකරුවන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිවීම අනිවාර්ය වුවත්, ඊට අනුකූල නොවන ලෙස ලංසු ලියවිලි සමඟ ලියාපදිංචිය ඉදිරිපත් නොකල හා ලියාපදිංචිය කල් ඉකුත්ව තිබුණු ලංසුකරුවන් වෙත අවස්ථා 09කදී වටිනාකම රු.5,928,038ක්වූ ලංසු | රෝහලේ ඉතා හදිසි ශල්‍ය කර්ම හා ශල්‍යාගාර සේවා අඛණ්ඩව පවත්වාගෙනයාම සඳහා රෝහලේ ලියාපදිංචි සැපයුම් ආයතන මගින් මිල ගණන් කැඳවනු ලබන බව, ඇතැම් අවස්ථාවලදී කල් ඉකුත්ව ඇති සහතික ඉදිරිපත් කොට ඇති බව, තාක්ෂණික ඇගයීම් කමිටුව මේ පිළිබඳව ලංසුකරුවන්ගෙන් විමසා ඇතත් ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතික ලැබීමට කල්ගතවන බව හා අදාල | ලියාපදිංචි සැපයුම්කරුවන් ගෙන් පමණක් ඖෂධ මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රදානය කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ අවධානය යොමුවී නොතිබුණි. | ලියාපදිංචිය ලැබුණු වහාම එය ඉදිරිපත්කරන බව දන්වා ඇති බව, සැපයුම්කරුවන්මීට ඉහතදීද රෝහල වෙත සැපයුම් කර ඇති බැවින් සෙසු පිරිවිතර ගැලපීම සහ අවම මිල පමණක් සලකා මිළදී ගැනීම සිදුකල බව. | |
| (ආ) | 2007 ඖෂධ හා උපාංග ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2 මාර්ගෝපදේශය ප්‍රකාරව හදිසි හා අත්‍යාවශ්‍ය අවස්ථාවක හැර මිලදිගැනීම්වලදී තාක්ෂණික ඇගයීම් කමිටුව සෞඛ්‍ය අමාත්‍යාංශ නියෝජිතයෙකු, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ නියෝජිතයෙකු, අවම විශේෂඥතාවක් සහිත උපදේශකවරුන් දෙදෙනෙකු හා මහා භාණ්ඩාගාරයෙන් නම් කරන ලද නියෝජිතයෙකුගෙන් සමන්විත වියයුතු වුවද, අවස්ථා 10කදී රෝහල විසින් මිලදීගත් රු. 27,461,853ක්වූ ඖෂධ හා උපාංග සම්බන්ධයෙන් එවැනි නියෝජනයක් සහිත කමිටුවක් පත් කර නොතිබුණි. | සියළුම ශල්‍ය ද්‍රව්‍ය සහ උපාංග ඉතා අත්‍යාවශ්‍ය සහ හදිසි ශල්‍ය උපාංග වන අතර සැලසුම් සහිත ශල්‍ය කර්ම හා ජීවිතාරක්ෂක ශල්‍ය කර්ම සඳහා ශල්‍යාගාර සැත්කම් සේවා අඛණ්ඩව පවත්වාගෙන යායුතු බැවින් රෝහල් අධ්‍යක්ෂ මණ්ඩල මගින් පාලනය වන රෝහලක් වශයෙන් අදාල ලංසුකරුවන් තෝරාගැනීම සඳහා රෝහල් අධ්‍යක්ෂ විසින් ශල්‍ය වෛද්‍යවරයෙකු, ඖෂධවේදියෙකු හා පරිපාලන නිලධාරීගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර ඇති බව. | ඖෂධ හා උපාංග ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය පරිදි රු.මිලියනයකට වැඩි භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් වන ප්‍රසම්පාදනයන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සභාපතීත්වයෙන් යුතු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් මගින් සිදුකළ යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස අවස්ථා 07කදී රු.24,726,763ක්වූ මිළදීගැනීම් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකර තිබුණි. | රෝහලේ හදිසි සහ අත්‍යාවශ්‍ය ඖෂධ සහ උපාංග මිළදී ගැනීම සඳහා පැවරී ඇති මූල්‍ය බලතල අනුව රු.100,000 දක්වා වූ සීමාව තුළ අධ්‍යක්ෂවරයාටත්. රු.100,000 සිට රු.මිලියන 12.5 දක්වා වූ සීමාව තුල ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවටත් පැවරී ඇති මූල්‍ය සීමාව තුල සිටිමින් සියළුම මිළදී ගැනීම් සිදුකර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශව ලට අනුකූලව කටයුතු කළ යුතුය. |

(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5(ආ) මාර්ගෝපදේශය පරිදි තත්කාර්යය සඳහා පත්කරන ලද ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විෂය පිළිබඳ දැනුම ඇති නිලධාරියෙකුගෙන් සමන්විතවන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමට පත්වන්නේනම් පමණක් තාක්ෂණික ඇගයීම් කමිටුවක සහාය නොමැතිව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිළිබඳව තීරණය කරන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවට විධානය කරනු ලැබිය හැකි නමුත්,එවැනි විධානයකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ එකතු වටිනාකම රු.2,802,965ක්වූ කොන්ත්‍රාත් 02ක් සඳහාවූ ප්‍රසම්පාදනයන් තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීමකින් තොරව සිදුකර තිබුණි. එසේම ප්‍රසම්පාදනයන් සඳහා සාප්පු ක්‍රමය (shopping) භාවිතයේදී රු.මිලියන 3.5ක් දක්වාවූ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් අවම වශයෙන් මුද්‍රා තබන ලද ලංසු 5ක් කැඳවීමට කටයුතු කළයුතු වුවත්, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදනයන් නිසි තරඟකාරීත්වයකට යොමුවී නොතිබුණු අවස්ථා විය.

රෝහලේ වාට්ටු අංක 5හි තුවාල සැරහුම් එම දමන ස්ථානය නවීකරණය කිරීම සහ මධ්‍යම වායු සමීකරණ පද්ධතිය සඳහා ආරක්ෂිත දැල ගැසීම යන කාර්යයන් සිදුකිරීමේදී රෝහලේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිලගණන් කැඳවා එම මිලගණන් සහිත ලංසු ලියවිලි රෝහලේ තාක්ෂණික නිලධාරීන්ගේ ඇගයීමට ලක්කර එම තාක්ෂණික ඇගයීම් වාර්තාවට අනුව මෙම අළුත්වැඩියා කටයුතු සිදුකරගෙන ඇති බව.